**කුරුණෑගල දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 56 - 2023**

---

**1. විගණන මතය**

1.1 කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 56 හි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2023 වර්ෂයට අදාළව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 56 කට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබුණු අතර එම වාර්තාවල කාරක සභා 10 ක මතය වියාචනය කර හා කාරක සභා 46 ක තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. ඒ සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 55 ක පිහිටි අක්.77 රූඩ් 01 පර්.37 ක ඉඩම් සහ ගොවිජන සේවා කාරක සභා 08 ක යන්ත්‍රසූත්‍ර 40 ක් පමණ, අල්මාරියක්, සේප්පුවක්, කාරක සභා ගොඩනැගිලි 02ක්, පොහොර ගබඩා 02ක්, නිල නිවාසයක්, අලෙවි සැල් 02ක් සහ පොහොර කි.ග්‍රෑ 23,484 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | පවරාගෙන නොමැති ඉඩම් පවරාගැනීමටත් ඉඩම් හා අනෙකුත් වත්කම් තක්සේරු කර වටිනාකම් ගිණුම්ගත කිරීමටත් කටයුතු කරන බව | කාරක සභාවට අයත් සියළු වත්කම් තක්සේරු කර ගිණුම් ගත කල යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 09 ක රු.663,010 ක් වූ ආදායම්ද, කාරක සභා 07 ක රු.370,327 ක් වූ ජංගම වත්කම්ද සහ කාරක සභා 02 ක රු.663,402 ක් වූ ජංගම වගකීම්ද සමාලෝචිත වර්ෂය තුළ ගිණුම්වලින් අත්හැරී තිබුණි. | අදාළ ගැලපුම් කර නිවැරදි කිරීම සඳහා කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයට අදාළ සියලුම ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 12 ක පෙර වර්ෂයට අදාළව සිදු කල රු.351,648ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | අදාළ ගැලපුම් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් වර්ෂයට අදාළ වියදම නිවැරදිව ගලපා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 09 ක රු.1,236,908 ක ආදායම්ද, කාරක සභා 23 ක රු.584,202 ක වියදම්ද, කාරක සභා 11 ක රු.1,192,283 ක ජංගම වත්කම්ද සමාලෝචිත වර්ෂය තුළ වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර ගොවිජන සේවා කාරක සභා 15 ක රු.1,957,773 ක ආදායම්ද, කාරක සභා 09 ක රු.30,788,958 ක වියදම්ද, කාරක සභා 19 ක රු.89,662,499 ක ජංගම වත්කම්ද කාරක සභා 03 ක රු.111,297ක ජංගම වගකීම්ද සමාලෝචිත වර්ෂය තුළ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අදාළ ගැලපුම් කර නිවැරදි කිරීම සඳහා කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් වර්ෂයට අදාළ ආදායම් හා වියදම් සම්පූර්ණව හා නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කාරක සභා 04 ක ගිණුම් ගත කර තිබුණු රු.457,845 ක තොග අයිතම හා කාරක සභා 09 ක ගිණුම් ගත කර තිබුණු රු.5,186,538 ක් වටිනා ස්ථාවර වත්කම් ඒකක 12 ක් හා තොග වර්ග 05ක් භෞතිකව නොපැවතුණි.. | භෞතිකව දක්නට නොමැති මෙම වත්කම් ගිණුම්වලින් ඉවත් කිරීම සඳහා අදාල කාරක සභා වෙතට උපදෙස් ලබාදීමට කටයුතු කරන බව | විධිමත් පරීක්ෂාවක් සිදු කර හේතු අනාවරණය කර ගැනීම හා ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල සුදුසු පරිදි ගැලපීම් කළ යුතුය. |
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා සහ ගොවිජන බැංකු 14 කට පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.2,718,870 ක මුදලක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ එම පද්ධති ස්ථාපිත නොකිරීම නිසා ගෙවූ මුදල අත්තිකාරම් ලෙස ගිණුම් ගත කළ යුතු වුවද, එය සමුච්චිත අරමුදලට හා බැංකු අරමුදලට කපා හැර තිබුණි. | අත්තිකාරම් ගෙවීමක් ලෙස ගිණුම් ගත කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගෙවූ අත්තිකාරම් ලෙස ගිණුම් ගත කළ යුතුය. |

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 24 ක ගිණුම් විෂයන් 96 කට අදාළව මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති ශේෂයන් උපයෝගී වාර්තා සමඟ සැසඳීමේදී එකතුව රු.36,859,840 ක වෙනසක් පැවතුණි. | ශේෂ නැවත පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරන බව | නොසැසඳුන ශේෂ සැසඳීම් කර නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ගැලපිය යුතුය. |

### 1.3.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 17 ක රු.438,266,722 ක් වටිනාකමැති ජර්නල් සටහන් 542 ක් සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. කාරක සභා 04 ක ජර්නල් සටහන් පිළියෙල කර නොතිබුණු අතර එක් කාරක සභාවක ආරම්භක ශේෂ සඳහා පමණක් ජර්නල් සටහන් පිළියෙල කර තිබුණි. | විධිමත් පරිදි අනුමැතිය ලබා ගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව | විධිමත් අනුමැතියක් සහිතව ජර්නල් සටහන් ඇතුළත් කළ යුතු අතර ආරම්භක ශේෂ හා ගැලපුම් සඳහා ජර්නල් සටහන් යෙදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04 ක් විධිමත් අනුමැතියකින් තොරව රු.908,593 ක් වටිනාකමැති හර ශේෂ 04 ක්ද, රු.384,537 ක වටිනාකමැති බැර ශේෂ 02 ක්ද සමුච්චිත අරමුදලට ලියා හැර තිබුණි. | විධිමත් පරිදි අනුමැතිය ලබා ගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව | කපා හැරීම් හා සමුච්චිත අරමුදලට ගැලපීම් කිරීම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. |

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොවිජන සේවා කාරක සභා 03 ක වසර 18ත් 19ත් අතර කාලයක සිට ඉදිරියට එන අවිනිශ්චිත ගිණුම් හර හා බැර ශේෂ පිළිවෙලින් රු.504,820 ක් හා රු.25,654 ක් විය. | පරික්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගොවිජන සේවා කාරක සභා 50 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.302,528,373 ක වත්කම් විෂයයන් 198ක සහ එකතුව රු.232,877,312ක වගකීම් විෂයයන් 104 කට අදාළ සවිස්තරාත්මක සටහන්, තක්සේරු වාර්තා, ශේෂ සනාථන සහතික, අදාළ වත්කම් ලේඛන සහ හිමිකම් සහතික පත්‍ර වැනි සාක්ෂි නොතිබීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම්කරණය පිළිබඳව දැනුමක් නොමැති නිලධාරීන් වැඩි පිරිසක් යොදවා ගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බවත් ඉදිරියේදී අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ තහවුරු කිරීමට අදාළ ලේඛන පවත්වා ගත යුතුය. |

### 1.4 නීතී, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **2000 අංක 46 දරන** ගොවිජන සංවර්ධන පනත | | | |
| (i) 14 (3) වගන්තිය | ආරවුල් පවතින කුඹුරුවල අඳ ගොවියන් විසින් ඉඩම් හිමියන්ට ගෙවීම පිණිස සභාවේ තැන්පත් කර තිබුණු ඉඩම් හිමි ප්‍රවේණි මුදල් රු.1,664,575 ක් ගොවිජන සේවා කාරක සභා 11 ක් විසින් ගෙවීම් කිරීම හෝ අධිකරණයේ තැන්පත් කිරීමට කටයුතු කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සභා අරමුදලේ රඳවා ගෙන තිබුණි. | ආරවුල් පැවතීම මත අඳ ගොවීන් වෙත ගෙවීම් කළ නොහැකිව පවත්නා ප්‍රවේණි මුදල් කඩිනමින් අධිකරණයේ තැන්පත් කිරීමට කටයුතු කරන බව | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ii) 52 වගන්තිය | සෑම කන්නයකටම පෙරාතුව ගොවිජන කාරක සභා බල ප්‍රදේශය සඳහා කෘෂිකාර්මික වැඩසටහනක් පිළියෙල කළ යුතු වුවත්, කාරක සභා 50 ක් විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ක්‍රියාත්මක සැලැස්ම හා අයවැය ඇස්තමේන්තුව සකස් කර අනුමැතිය සහිතව ඉදිරිපත් කර ඇති බව | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) 53 (4) වගන්තිය | සෑම වසර 03 කට වරක්ම ඉඩම් නාම ලේඛන ප්‍රතිශෝධනය කළ යුතු වුවත්, සියළුම ගොවිජන සේවා කාරක සභා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ නියෝගය මත ප්‍රතිශෝධන හා සංශෝධන කටයුතු සිදු කර යාවත්කාලීන කරන බව | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 137 | සේවාවන්, වැඩ හෝ සැපයුම් සම්පූර්ණ කෙරුණු විට බලය දෙනු ලබන නිලධාරියා වන කාරක සභාපති විසින් සියලුම ගෙවීම් වවුචර් අනුමත කළ යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 06 ක අවස්ථා 111 කදී රු.2,035,099 ක වවුචර් අනුමත කර නොතිබුණි. | අවශ්‍ය උපදෙස් ලබාදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 237 (ආ) | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී භාණ්ඩ ලැබී ඇති බවට තහවුරු කරමින්, අදාල බඩු තොග පොතට ඇතුලත් කර ඇති බවට සඳහන් කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ රු.2,703,072 ක මිලදීගැනීම්වලට අදාළව ගොවිජන සේවා කාරක සභා 09 ක් විසින් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | - එම - |
| (iii) මුදල් රෙගුලාසි 264 | සෑම ගෙවීමකටම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ රු.118,132,779ක් වටිනාකමැති ගෙවීම් වවුචර් 266 ක් සම්බන්ධයෙන් ගොවිජන සේවා කාරක සභා 19ක් එපරිදි කටයුතු කර නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි 880 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටසේ 09 ඡේදය | මුදල් හෝ තොග සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා බලය ලබා දී ඇති සියලුම නිලධාරීන් විසින් ඇප තැබිය යුතු වුවද, ගොවිජන සේවා කාරක සභා 51 ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ඇප තබා නොතිබුණු අතර ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ 2023 පෙබරවාරි 13 දිනැති අංක DAD/KNG/EST/5/ARPA/17 දරන චක්‍රලේඛයෙන් උක්ත මුදල් රෙගුලාසියට අනුකූල නොවන පරිදි කෘ.ප.නි.ස නිලධාරීන් ඇප තැන්පත් කිරීමෙන් නිදහස් කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ඇප තැබීමෙන් නිදහස් කර ඇති බව | මුදල් රෙගුලාසි 880 සහ අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

(ඇ) **ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ**

| | | | | |
|---|---|---|---|---|
| (i) | 1988 මැයි 22 දිනැති අංක 322 දරන චක්‍රලේඛය | ඉඩම් හිමි ප්‍රවේණි බදු මුදල් භාරගත් දින සිට දින 14 ක් ඇතුලත අදාල පුද්ගලයින්ට ගෙවීම් කලයුතු අතර අවුරුද්දක කාලයක් තුල මෙම මුදල් භාර නොගන්නේ නම් හා අයිතිකරුවන් කිහිප දෙනෙක් ඇති අයිතිකරු පැහැදිලි නැති ප්‍රවේණි මුදල් අධිකරණයේ තැන්පත් කිරීමට කටයුතු කල යුතු නමුත් ගොවිජන සේවා කාරක සභා 02 ක දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එන ලද රු.1,638,418 ක ඉඩම් හිමි ප්‍රවේණි මුදල් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන චක්‍රලේඛයේ 5.6 (i) ඡේදය | ගොවිජන බැංකුව ගොවිජන කාරක සභාවේ ඒකකයක් බැවින් ගොවිජන බැංකුවට අදාළ සියළුම ගිණුම් ගොවිජන සේවා කාරක සභාවේ වාර්ෂික ගිණුම්වලටද ඇතුළත් කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, කාරක | ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි සකස් කිරීමට කටයුතු කරන බව | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | සභා 56 ම එසේ කටයුතු කර නොතිබුණි. | | |
| (iii) | 2014 අගොස්තු 22 දිනැති අංක 7/2014 (107 සංශෝධන III) දරන චක්‍රලේඛය | දෛනිකව කම්වු ලිපිකරුට අත රඳවා ගත හැකි උපරිම මුදල රු.10,000 ක් වුවද ගොවිජන සේවා කාරක සභා 20 ක අවස්ථා 885 කදී ඊට වැඩි මුදලක් අත රඳවා ගෙන තිබුණි. | නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇති බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (iv) | 2016 පෙබරවාරි 09 දිනැති අංක 3/2016 දරන චක්‍රලේඛය | වර්ෂයකට අවම වශයෙන් හතරවරක්වත් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ද, වර්ෂයකට අවම වශයෙන් එක් වරක් විධායක ලේකම්ද, ගොවි සංවිධාන පරීක්ෂා කල යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 08ක බල ප්‍රදේශයට අයත් ක්‍රියාකාරී ගොවි සංවිධාන 276ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර ඇති බවට කාරක සභාව සතුව සනාථන නොවිණි. | අදාළ නිලධාරින් දැනුවත් කිරීමට කටයුතු කරන බව | - එම - |
| (v) | 2019 ඔක්තෝබර් 22 දිනැති අංක 7/12/5/4 දරන ලිපිය හා 2020 ඔක්තෝබර් 08 දිනැති අංක 09/2020 දරන චක්‍රලේඛය | සියලුම ලියාපදිංචි ගොවි සංවිධානවල ගනුදෙනු අදාළ ගොවිජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක් මගින් සිදු කළ යුතු නමුත් ගොවි සංවිධාන 684 කින් සංවිධාන 195 ක් ගොවිජන බැංකුවේ ගිණුම් ආරම්භ කර නොතිබුණි. | ප්‍රායෝගික දුෂ්කරතා හේතු කර ගෙන ගොවි සංවිධාන විසින් ගොවිජන බැංකුවේ මුදල් තැන්පත් කිරීමට මැලිකමක් දක්වන බව | - එම - |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 56 හි එකතුව රු.29,659,057ක ශුද්ධ අතිරික්තයක්ද, ගොවිජන බැංකු 56 හි එකතුව රු.23,195,296 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව 2022 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 56 හි එකතුව රු.22,235,476 ක ශුද්ධ අතිරික්තයක්ද, ගොවිජන බැංකු 56 හි එකතුව රු.14,306,012 ක අතිරික්තයක්ද විය.

### 2.1.1 විශ්ලේෂණාත්මක සමාලෝචනය

i. සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 52 ක රු.30,415,250 ක අතිරික්තයක් ලබාගෙන තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 51 ක අතිරික්තය රු.23,250,111 ක් විය. ඒ අනුව රු.7,165,139 ක අතිරික්තයේ වැඩිවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ කාරක සභා 04 ක ඌනතාවය රු.756,193 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක සභා 05 ක ඌනතාවය රු.1,014,635ක් විය.

ii. පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය, බීජ, පැළ, කෘෂි උපකරණ ඇතුළු කෘෂිකාර්මික භාණ්ඩ අලෙවි කිරීමට අදාළ සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 56 හි මුළු අලෙවි ආදායම එකතුව රු.210,691,361 ක් ද මුළු දළ ලාභයේ එකතුව රු.7,661,969 ක් ද විය. ඒ අනුව ගොවිජන සේවා කාරක සභා 56 හි සමස්ථ දළ ලාභ අනුපාතය නියයට 4 ක් ව පැවතුණි.

iii. ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 56 හි මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| | | ------------- |
| ➢ සමුච්චිත අරමුදල්වල වටිනාකම (ශුද්ධ වත්කම්) | = | 379,473,683 |
| ➢ දිගුකාලීන ණය වටිනාකම | = | 30,362,741 |
| ➢ ජංගම බැරකම් | = | 1,315,828,830 |
| ➢ මුළු වත්කම් | | |
| • ජංගම වත්කම් | = | 1,470,834,614 |
| • ජංගම නොවන වත්කම් | = | 254,830,640 |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අතිරික්ත මුදල් ආයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 56 හා ගොවිජන බැංකු 56 විසින් එකතුව රු.91,606,818 ක් ඵලදායීව ආයෝජනය කිරීමෙන් තොරව රජයේ වාණිජ බැංකු 02 හි ජංගම ගිණුම්වල රඳවාගෙන තිබුණු අතර, එකතුව රු.102,467,018 ක මුදලක් අඩු පොලී ආදායමක් ලැබෙන ඉතුරුම් තැන්පතුවල ආයෝජනය කර තිබුණි. ඒ අනුව අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | අරමුදල් ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවීමට කටයුතු කරන බව | අරමුදල් වඩාත් ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවිය යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාවතගම ගොවිජන සේවා කාරක සභාවේ 2020 වර්ෂයට අදාලව හඳුනා ගන්නා ලද තොග ඌනතා සඳහා අයකරගත යුතු රු.771,097 ක් සමාලෝචිත වර්ෂයේදීත් අදාල පාර්ශ්ව වෙතින් අයකරගෙන නොතිබුණි. | පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අය විය යුතු මුදල් කඩිනමින් අය කර ගත යුතුය. |
| (ආ) | රඹේ ගොවිජන සේවා කාරක සභාවේ 1999 වර්ෂයට පෙර කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස.) නිලධාරියෙකු විසින් ගොවිජන බැංකු මුදල් හා අක්කර බදු මුදල් අයථා ලෙස පරිහරණය කිරීමෙන් සිදු කළ මූල්‍ය වංචාවට අදාළව අයවිය යුතු රු.137,706ක් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීත් කටයුතු කර නොතිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව | - එම - |
| (ඇ) | නාථගනේ ගොවිජන බැංකුව නිවැරදිව මුදල් පොත තුලනය නොකිරීම, ණය නිකුත් කිරීමේදී චෙක්පත් අවභාවිතා කිරීම, ලෙජර් ගත නොකළ ණය මුදල් හා ඊට අදාල පොළිය වශයෙන් ගොවිජන බැංකුවේ 2020 ජනවාරි 01 සිට 2021 ජූලි 05 දින දක්වා කාලයට අදාලව සිදුවූ ගනුදෙනු මඟින් කර ඇති එකතුව රු.2,954,156ක ඌනතාවය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර, කුවිතාන්සි පොත් 06 ක් අස්ථානගතවී තිබුණු අතර එම කුවිතාන්සිවලට අදාළව ගනුදෙනු සටහන්වීද නොතිබුණි. | විමර්ශන කටයුතු සිදු කරමින් පවතින බව | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තාරණ ගොවිජන බැංකුවේ ලෙජර් පරික්ෂා කිරීමෙන් අනාවරණය කර ගත් රු.3,310,450 ක මූල්‍ය වංචාවකින් තවදුරටත් අය විය යුතු ශේෂය රු.2,523,592 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේදී එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විමර්ශන කටයුතු සිදු කරමින් පවතින බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අය විය යුතු මුදල් කඩිනමින් අය කර ගත යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 11 ක පිහිටුවා ඇති ගොවි සංවිධාන 358 කින් සංවිධාන 17 ක් අක්‍රීයව පැවතුණ අතර පිහිටුවා ඇති සිතමු කාන්තා ගොවි සංවිධාන 117 කින් 32 ක් ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි. | අක්‍රීය සමිති ක්‍රියාකාරීව පවත්වා ගෙනයාමට උපදෙස් ලබාදී ඇති බව | ගොවි සංවිධාන ක්‍රියාකාරී මට්ටමින් පවත්වාගෙන යාමට වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | වත්කම් අත්පත් කර ගැනීමට අදාලව දීර්ඝ කාලයක සිට ගෙවිය යුතු ණය ලෙස ඉදිරියට ගෙන එනු ලබන ගොවිජන සේවා කාරක සභා 13 ක රු.7,892,993ක ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණ අතර මෙම ණය ශේෂයන්ට අදාල වත්කම් බොහොමයක් කාරක සභාව තුළ භෞතිකව දක්නටද නොලැබුණි. | ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ලබා ගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව | ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කිරීමටත්, වත්කම් භෞතිකව නොමැතිවීමට හේතු පරික්ෂා කර විධිමත් කිරීමට පියවර ගැනීමත් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය වන විට ගොවිජන සේවා කාරක සභා 22 ක වී වගාව සඳහා යෙදවිය හැකි A ශ්‍රේණියේ පුරන් කුඹුරු ප්‍රමාණය අක්කර 384 රූඩ් 38 පර්චස් 13ක් පමණ වන අතර ගොවිජන සේවා කාරක සභා 11 ක වී වගාව හැර වෙනත් වගාවන් සඳහා යෙදවිය හැකි B ශ්‍රේණියේ පුරන් කුඹුරු ප්‍රමාණය අක්කර 146 රූඩ් 03 පර්චස් 28 ක් පමණද ගොවිජන සේවා කාරක සභා 19 ක C කාණ්ඩයට අයත් පුරන් කුඹුරු ප්‍රමාණය අක්කර 725 රූඩ් 01 පර්චස් 07ක් පමණ විය. මෙම පුරන් කුඹුරු සමාලෝචිත වර්ෂය තුළ වී වගාව හෝ වෙනත් වගාවන් සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. | පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා අදාළ කටයුතු සිදු කරන බව | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව සෑම කුඹුරු ඉඩමක්ම අදාල පරිදි වගාව සඳහා යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නිලධාරින්ගේ කාර්යාලයට පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා 2020 වර්ෂයේදී එකක් රු.54,275 බැගින් රු.3,039,400 ක් වැය කර ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගෙන තිබුණද ගොවිජන සේවා කාරක සභා 11 ක එම යන්ත්‍ර ක්‍රියාවිරහිත වී තිබුණු අතර මෙම යන්ත්‍රවලින් මුද්‍රණ පිටපත් ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමටද නොහැකි වී තිබුණි. | යන්ත්‍ර ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 13 කින් 2002 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලයට අදාළව එකතුව රු.341,326 ක විගණන ගාස්තු අය විය යුතුව පැවතුණි. | 2024 වර්ෂයේ රු.14,400 ක් ගෙවා ඇති බව | හිඟ විගණන ගාස්තු ගෙවීමට කටයුතු කළ යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එනු ලබන ගොවිජන සේවා කාරක සභා 30 ක රු.30,062,249 ක ලැබිය යුතු ශේෂ 266 ක් අය කර ගැනීමටත් රු.25,543,033 ක ගෙවිය යුතු ශේෂ 277 ක් නිරවුල් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව | මුල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම පැවත එන ලැබිය යුතු ශේෂ සහ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

**3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 28 ක ට්‍රැක්ටර් රථ හා උපකරණ 03ක්, තණකොළ කුඩුකරන යන්ත්‍ර 06 ක්, තණකොළ කපන යන්ත්‍ර 03ක්, ගබඩා 03 ක්, ජල බිංදු පද්ධතියක්, පැල සිටුවන යන්ත්‍ර 21 ක්, වල් නෙලන යන්ත්‍ර 15 ක්, බීජ සිටුවීමේ යන්ත්‍ර 03ක්, පැල කූටි සහ දැල් ගෘහ 14 ක්, බිත්ති සේප්පු 03 ක්, බිම් තරාදියක්, අලෙවිසැල් 03 ක්, යන්ත්‍රෝපකරණ 06 ක්, ඇඟිලි සලකුණු යන්ත්‍ර 05 ක්, පරිගණක 05 ක්, ෆැක්ස් යන්ත්‍ර 02ක්, | අපහරණය කිරීමට හෝ ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට කටයුතු කරන බව | භාවිතයට ගත හැකි වත්කම් හා උපකරණ පූර්ණ ලෙස උපයෝජනය කිරීමටත් අනිකුත් වත්කම් හා උපකරණ විධිමත්ව අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |

රූපවාහිනියක්, වතුර ටැංකියක්, මල්ටි වොපර් 03 ක්, බීජ වැපුරුම් යන්ත්‍ර 04 ක්, යාන්ත්‍රික පැල සිටුවීමේ යන්ත්‍රයක්, ඡායා පිටපත් යන්ත්‍රයක්, කෘෂි උපකරණ 5,524 ක්, කිරිහල ගොඩනැගිල්ල හා උපකරණ, කාලගුණ ඒකකයට අදාළ ටැබ් යන්ත්‍රය, බිම්මල් බීජ නිෂ්පාදනාගාරය හා ඊට අදාළ උපකරණ, බේකරිය හා අදාළ උපකරණ හා ජලඋසමාපක 139 ක් නිශ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතුණි.

## 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සේවා කාරක සභා 51 ක පැවති සුළු වාරි වැව් 5,495 ක්, අමුණු 937 ක් සහ ඇල මාර්ග හා පැති බැමි 362 කින් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ප්‍රමුඛතාව අනුව සකස් කළ ව්‍යාපෘති 583 ක් ඉදිරිපත් කර තිබුණද ව්‍යාපෘති 25 ක් පමණක් ක්‍රියාත්මක වී තිබුණි. | වෙන් කරන ලද ප්‍රතිපාදන මත කටයුතු කරන බව | වාරිකර්මාන්ත හා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු හා ඉදි කිරීම් කටයුතු යාවත්කාලීනව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

# 04. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාලව ගොවිජන සේවා කාරක සභා 56 හිම ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණද, ඊට අදාළ ප්‍රගති වාර්තා සකස් කර නොතිබුණි. | වාර්ෂික ප්‍රගතිය ඇතුළත් කාර්ය සාධන වාර්තාවක් සකස් කිරීමට කටයුතු කරන බව | කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාලව කාරක සභා 56 පිළියෙල කර තිබුණු අයවැය ඇස්තමේන්තු අනුව ආදායම් හා වියදම් විෂයයන් 755 කට අදාළව සියයට 01 සිට සියයට 9,058 දක්වා විචලනයන් පැවතුණි. මේ හේතුවෙන් පාලන | පාලනය කළ නොහැකි හේතු මත අයවැය විචලනයන් ඇති වන බව | අයවැය ඇස්තමේන්තුව සඵලදායී පාලන උපක්‍රමයක් ලෙස යොදා ගත යුතුය. |

ක්‍රමවේදයක් ලෙස යොදා ගනු ලබන අයවැය ලේඛනය කාරක සභා විසින් සඵලදායී පාලන උපක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 05. ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගනේවත්ත ගොවිජන බැංකුව විසින් ප්‍රාග්ධන මුදල් සඳහා පොලී ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව රු.140,849 ක් දඩ පොලී වශයෙන් ගෙවා තිබුණි. | කාරක ප්‍රාග්ධනය නොමැති වීම නිසා නියමිත කාලය තුළ පියවීමට නොහැකි වූ බව | නියමිත කාලය තුළ පොලී ගෙවීම් සිදු කළ යුතුය |
| (ආ) | ගොවිජන බැංකු 06 ක රු.119,705,130 ක වටිනාකමැති ජර්නල් සටහන් 77 ක් සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ජර්නල් සටහන් සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. |
| (ඇ) | ගොවිජන බැංකු 02 ක වටිනාකම රු.1,229,550ක කොටස් තැන්පතු සඳහා ලෙජර් ගිණුම් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව | ලෙජර් ගිණුම් නිසි පරිදි පවත්වා ගෙන යා යුතුය. |
| (ඈ) | ගොවිජන බැංකු 18 ක කොටස් තැන්පතු ගිණුම් 43,055 කින් 29,021 ක්ද, ගොවිජන බැංකු 13 ක සාමාන්‍ය තැන්පතු ගිණුම් 25,007 කින් 14,563 ක්ද, ගොවිජන බැංකු 29 ක ළමා තැන්පතු ගිණුම් 2,809 කින් 1,631 ක්ද, ගොවිජන බැංකු 19 ක ගොවි සංවිධාන තැන්පතු ගිණුම් 3,644 කින් 1,341 ක්ද ගොවිජන බැංකු 22 ක කුඩා කණ්ඩායම් තැන්පතු ගිණුම් 1,746 කින් 877 ක්ද ගොවිජන බැංකු 15 ක සිතමු කාන්තා තැන්පතු ගිණුම් 492 කින් 133 ක්ද ක්‍රියාකාරී තත්ත්වයෙන් තොරව ආරම්භක තැන්පතුවලට පමණක් සීමා වී තිබුණි. | තැන්පතු වර්ධනය කර ගැනීම සඳහා පියවර ගන්නා බව | ගිණුම් ක්‍රියාකාරී තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඉ) | ගොවිජන බැංකු 31 ක සමාලෝචිත වර්ෂය තුළ එක් මාසයක සිදු කරන ලද ගනුදෙනු පරික්ෂා කිරීමේදී දෛනිකව සිදු කර තිබුණු බැංකු ගනුදෙනු | අඩු තාක්ෂණික පහසුකම් යටතේ ගනුදෙනුකරුවන් දායක කර ගැනීමේ හැකියාව අඩු බව | ගනුදෙනු වර්ධනය කර ගැනීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සාමාන්‍ය 01 ත් 14 ත් අතර ඉතා පහළ මට්ටමක පැවතුණි. | | |
| (ඊ) | ගොවිජන බැංකු 50 ක ආරම්භයේ සිට 2021 වර්ෂය දක්වා නිකුත් කරනු ලැබූ ණය මුදල් රු.107,580,997 ක් ණයගැතියන් 2,999 කින් අයකරගෙන නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව ණය මුදල් නියමිත කාලය තුළ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |